*සැ. යු.* - 2026.06.26 දින පළ වූ අංක 2495 *ගැසට් පත්‍රයේ* I කොටස III ඡේදය පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,496 - 2026 ජූලි මස 03 සිකුරාදා - 2026.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | — |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


*සැ. යු.* - ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2026.06.26 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 24 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 10 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


163 - B 082806 — (2026/07)
C 1 -

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන තම සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 09, බේස්ලයින් පාර, අංක 627 හි පිහිටා ඇති වෙරුබියම් ලංකා (පුද්ගලික) සමාගම (කලින් මරීනා ෆුඩ්ස් (පුද්ගලික) සමාගම සහ මුලින් වෙරුබියම් ලංකා (පුද්ගලික) සමාගම,

අධිකරණය විසින් ඈවර කරනු ලැබීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ වූ ඉල්ලීමකි.

*නඩු අංකය* : COL/CHC/CO/00026/2026
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම

*ඈවර කරනු ලැබීමට ඉල්ලා සිටින සමාගම :*

TÜRKİYE İHRACAT KREDİ BANKASI A. S.
Also known as Türk Eximbank,
Inkilap Mahallesi, Dr. Adnan Büyükdeniz Caddesi,
No. 7/B 34768,
Ümraniye, İstanbul, Republic of Türkiye.

තම ඇටර්නි බලකරුවන් වන කොළඹ 12, විල්සන් වීදිය, අංක 19 දරන ස්ථානයෙහි මොහොමඩ් අක්‍රම් ඩීන් මොහොමඩ් ඉර්ෂාඩ්

*සහ*

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, රාජගිරිය, ඔබේසේකරපුර, වෛශාක්‍ය මාවත, අංක 208 හි පදිංචි, හෙට්ටිආරච්චිගේ සුදර්ශන මධුෂංක සෙනෙවිරත්න මගින් පෙනී සිටි.

*............පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2026 මැයි මස 21 දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් කේ. පී. ලෝ ඇසෝසියේට්ස් නීතිඥ සමාගම විසින් ඉදිරිපත්කර ඇති බව ද, එකී පෙත්සම 2026 සැප්තැම්බර් මස 03 දින මෙම අධිකරණය ඉදිරියේ විභාග කිරීමට නියමකර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධවීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. පී. ලෝ ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු,
අංක 218, දෙවන මහල,
අලුත්කඩේ වීදිය,
කොළඹ 01200.

***සටහන.-*** එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් කේ. පී. ලෝ ඇසෝසියේට්ස් වෙත භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 02 දින ප. ව. 6.00 පසු වීමට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව දැනුම් දිය යුතු ය.

07 - 40

## කොළඹ දී පැවැත්වෙන තම සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

පිළිමතලාව 20450, කොළඹ පාර හි පිහිටා ඇති Sripola (Private) Limited

අධිකරණය විසින් ඈවර කරනු ලැබීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ වූ ඉල්ලීමකි.

*ඈවර කරනු ලැබීමට ඉල්ලා සිටින සමාගම :*

*නඩු අංකය* : COL/CHC/CO/00027/2026
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම

TÜRKİYE İHRACAT KREDİ BANKASI A. S.
Also known as Türk Eximbank,
İnkilap Mahallesi, Dr. Adnan Büyükdeniz Caddesi,
No. 7/B 34768,
Ümraniye, İstanbul, Republic of Türkiye.

තම ඇටර්නි බලකරුවන් වන කොළඹ 12, විල්සන් වීදිය, අංක 19 දරන ස්ථානයෙහි මොහොමඩ් අක්‍රම් ඩීන් මොහොමඩ් ඉර්ෂාඩ්

*සහ*

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, රාජගිරිය, ඔබේසේකරපුර, වෛශාක්‍ය මාවත, අංක 208 හි පදිංචි, හෙට්ටිආරච්චිගේ සුදර්ශන මධුෂංක සෙනෙවිරත්න මගින් පෙනී සිටී.

............*පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2026 මැයි මස 21 දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් කේ. පී. ලෝ ඇසෝසියේට්ස් නීතිඥ සමාගම විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2026 සැප්තැම්බර් මස 03 දින මෙම අධිකරණය ඉදිරියේ විභාග කිරීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. පී. ලෝ ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු,
218, දෙවන මහල,
අලුත්කඩේ වීදිය,
කොළඹ 01200.

***සටහන.-*** එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් කේ. පී. ලෝ ඇසෝසියේට්ස් වෙත භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 02 දින ප. ව. 6.00 පසු වීමට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව දැනුම් දිය යුතු ය.

07 - 39

**පාර්ලිමේන්තුව**

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

දිනේෂ් හේමන්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝග යටතේ "ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි." යනුවෙන් හැඳින්වෙන කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සංස්ථාගත කිරීමයි.

(අ) පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පොලිම කර්මාන්තය නංවාලීම සඳහා අධ්‍යාපනය කාර්මික පුහුණුව මානව සම්පත් සංවර්ධනය සැපයීමේ ලා විශිෂ්ටයකු ලෙස කටයුතු කිරීම.

(ආ) ප්ලාස්ටික් රබර් ආයතනය විසින් පවත්වනු ලබන වැඩමුළු සම්මන්ත්‍රණ සහ සාකච්ඡාවලට සහභාගී වීමෙන් පොලිම කර්මාන්තයේ නියැලී සිටින අනෙකුත් ආයතන සමග සහසම්බන්ධතාවයෙන් කටයුතු කිරීමට අවස්ථාව උදාකර දීම.

දිනේෂ් හේමන්ත,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී,<br>
මාතලේ දිස්ත්‍රික්කය.

07 - 100

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.**- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2026.08.07 | සිකුරාදා | 2026.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.14 | සිකුරාදා | 2026.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.21 | සිකුරාදා | 2026.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.28 | සිකුරාදා | 2026.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2026.09.04 | සිකුරාදා | 2026.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.11 | සිකුරාදා | 2026.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.18 | සිකුරාදා | 2026.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.09.25 | සිකුරාදා | 2026.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
*රජයේ මුද්‍රණාලයාධිපති.*

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.